# ගඟ වැවක් වීම හා වැව ගඟක් වීම

වැවක් හෝ දෙකක් හෝ පමණක් මෙරට නිර්මාණය කෙරී නැත. මෙරට ඇත්තේ වැව් පද්ධතියකි. වැව් සම්බන්ධයෙන් බොහෝ දෙනා නොයෙකුත් දේ කියා ඇති මුත් මේ කරුණ අවශ්‍ය තරමින් සාකච්ඡා කෙරී ඇතැයි මම නො සිතමි. වැව් වර්ගීකරණය වැව් නිර්මාණයෙහි දී යොදාගත් තාක්ෂණය, වැවෙහි ජල පෝෂණ ප්‍රදේශය, වැවෙහි ප්‍රයෝජනය, සමාජයට ඉන් වූ බලපෑම ආදිය විවිධ පුද්ගලයන් අතින් විවිධ අවස්ථාවල දී සාකච්ඡා වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් නැවතත් සඳහන් කිරීම අවශ්‍ය නැත. එහෙත් වැව් පද්ධතිය එපමණට ම විශ්ලේෂණය වී නැත.

වැව් එකිනෙකට එක් එක් ආකාරයට යා වී ඇත. මහ වැවක් හා ඒ ආශ්‍රිත කුඩා වැව් එකිනෙක සමගත් මහ වැව සමගත් සම්බන්ධ වී ඇත්තේ ඇළවල් මාර්ගයෙනි. ඇළක් හා වැවක් අතර ඇති සම්බන්ධය කුමක් ද? ඇළක් යනු වැවකට වතුර ගෙන යන ජල මාර්ගයක් පමණක් නො වෙයි. එය වැවෙන් පිටතට ද ජලය ගෙන යන ජල මාර්ගයක් විය. වැවෙන් පිටතට ජලය ගෙන ගියේ එක්කෝ වගාවට ය. එසේත් නැත්නම් තවත් වැවකට හෝ ගඟකට ය.

වගාවට ගෙන ගිය ජලය බොහෝ විට එතැනින් එහාට නො ගියේ ය. අතැම් විට එතැනින් පිටතට ගියේ නම් ඒ නැවත ජල මාර්ගයකින් තවත් වැවකට ය. එසේත් නැත්නම් තවත් ඇළකට හෝ ගඟකට ය. වැවකින් වගාවකට ගිය ජලයෙන් පොළොවට උරාගත් හෝ රැඳුණු යම් ප්‍රමාණයක් හැරෙන්නට අනෙක් ජලය ගතික පද්ධතියකට එකතු වී තිබුණි. වැවකට ජලය ඇතුල්වීමක් මෙන් ම පිටවීමක් ද විය.

එසේ ගත්කල වැව ස්ථිතික වස්තුවක් නො වී ය. වැවක් හා වෙනත් සංස්කෘතිවල ජනතාව විසින් නිර්මාණය කටනු ලැබූ විලක් (lake) අතර විශාල වෙනසක් විය. විලකට සමහර විට පිටින් ජලය ගෙන ඒමට හැකි වුවත් විලක් යනු තනි වස්තුවක් මිස පද්ධතියක කොටසක් නො වී ය. විල බොහෝ විට හුදු නගර අලංකාරය සඳහා නිර්මාණය කරනු ලැබූවක් විය. වැව ජනතාවගේ නිෂ්පාදන කාර්යයට හා සමජයීය ජීවිතයට විශාල ආධාරයක් විය. බොහෝ විට ගමෙහි සමාජයීය ජීවිතය වැව (හා පන්සල) වටා විය.

වැවකට ජලය ලබාගැනීමේ දී ඇතැම් විට ගඟක් හෝ ඇළක් හරස් කෙරුණ ද, ඉන් ගඟට හෝ ඇළට හෝ ප්‍රශ්නයක් නො වී ය. ගඟෙහි එක් කොටසක් සාමාන්‍ය ආකාරයට ගලා ගිය අතර අනෙක් කොටස තාවකාලික ව වැවක් බවට පත්විය. මෙහි තාවකාලික ව යන වචනය යෙදී ඇත්තේ වැවෙහි ජලය සමස්තයක් ලෙස ගත්කල විලක ජලය මෙන් එතැන ම නොරැඳුණු බැවිනි. මෙහි දී සිදු වූයේ චක්‍රීය ක්‍රියාවලියකි.

වැවක් බවට පත් වූ ජලය අනතුරුව ඇළකට හෝ ඇළක් මගින් ගඟකට හෝ එකතු වෙයි. එක් අවස්ථාවක දි ගඟක් වන ජලය තවත් අවස්ථාවක දි වැවක් ද නැවතත් ගඟක් ද බවට පත්වෙයි. ඒ අරුතින් ගත්කල අපට වැව ගඟක කොටසක් ලෙස ද සැලකිය හැකි ය. ගඟක හෝ ඇළක හෝ ජලය වැවක් ඔස්සේ නැවතත් ගඟක හෝ ඇළක හෝ ජලය බවට පත්වෙයි.

වැව, ඇළ හා ගඟ එකම ජල පද්ධතියක් විය. වැවෙහි දී ජලය ජලජ පැලෑටි ආශ්‍රයෙන් යම් පිරිසිදු කිරීමකට ද භාජනය විය. සිරුරේ රුධිර පද්ධතිය හා සැලකීමෙහි දී වැව එක්තරා අයුරකින් හදවතේ කාර්යභාරය ඉටු කෙළේ ය. ගමෙහි හදවත ලෙස ද වැව සැලකිය හැකිවීම මෙහි අපූර්ව ලක්ෂණයකි. මෙහි දී යම්කිසිවකු සිරුරෙහි ඇත්තේ එක් හදවතක් පමණක් බව ද එහෙත් වැව් රාශියක් ඇති බව ද පැවසීමට හැකි ය. එහෙත් ඕනෑම සාදෘශ්‍යයක් වලංගු වන්නේ සීමාකාරීව බව එහි දී මතක් කළ යුතුව ඇත.

වැව් පද්ධතිය එලෙස පද්ධතියක් ලෙස ගඟ වැව වීම වැව ගඟ වීම වන ආකාරයට නිර්මාණය කිරීමට හේතු වී ඇත්තේ චක්‍රිය චින්තනය බව පැහැදිලි ය. යක්ෂ ගෝත්‍රිකයන් තම තාක්ෂණය රැගෙන දඹදිවට (භාරතයට) හා ලංකාවට පැමිණෙන විට චක්‍රිය චින්තනය ප්‍රධාන චින්තනය ලෙස ඉතිරි වී තිබුණේ ලංකාවේ පමණක් බව පැහැදිලි ය. සංසාර චක්‍රය පිළිබඳ අදහස භාරතයෙහි ඉතිරි වී තිබුණ ද, පසුව බුදුන් වහන්සේ චක්‍රිය චින්තනය මත පදනම් වී

© Prof. Nalin De Silva

ධර්ම චක්‍ර ප්‍රවර්තන සූත්‍රය දේශනා කළ ද, යක්ෂ ගෝත්‍රිකයන් පැමිණෙන විට භාරතයේ අධිපතිවාදී චින්තනය බවට පත්ව තිබුණේ ඒක රේඛීය චින්තනයකි. කෙටියෙන් කිවහොත් ඒ වන විට දඹදිව සමස්තයක් ලෙස ගතහොත් භාරතය බවට පත් වී අවසාන ය.

එවකට විශ්ව නිර්මාණය භාරතයෙහි ප්‍රධාන මතවාදය බවට පත් වී තිබුණි. බ්‍රහ්මන් විසින් ලෝකය නිර්මාණය කරනු ලැබීම බටහිර ආසියාවේ ඇති වූ යුදෙව්, ක්‍රිස්තියානි හා ඉස්ලාම් නිර්මාණවලට වඩා වෙනස් නමුත් මූලික වශයෙන් ගත්කල එක් තැනකින් ඇරඹී විකාශය වීමක් නිරූපණය කෙළේ ය. දෙවියන් වහන්සේ කෙනකු (නිර්මාපකයකු) ඇතිව හෝ නැතිව (මහා පිපුරුමෙහි මෙන්) හෝ කෙරෙන නිර්මාණ ඒක රේඛීය චින්තනවල උපත ලබයි. මේ චින්තනවල බොහෝ විට ලෝක විනාශයක් ද දැකිය හැකි ය.

වෛදිකයෝ ලෝක නිර්මාණය ශිව දෙවියන්ට ද ලෝකය පවත්වාගෙන යෑම විෂ්ණු දෙවියන්ට ද, ලෝක විනාශය ඊශ්වර දෙවියන්ට ද භාර කළහ. මේ දෙවිවරු තිදෙනාම බ්‍රහ්මන්ගේ ත්‍රිමූර්තිය වීමෙන් පෙන්නුම් කරන්නේ සියල්ල පිටුපස එක් බලවේගයක් ඇති බවත් ඇත්තේ රේඛීය විකාශයක් බවත් ය. එහෙත් වෛදිකයෝ එක් එක් පුද්ගලයා සම්බන්ධයෙන් ගත්කල සංසාර චක්‍රය අදහස තවදුරටත් රැකගත්හ. එහෙත් එහි ද මැවීමක්, පටන්ගැනීමක් විය. එමෙන් ම දිගින් දිගට ම යන ආත්මය පිළිබඳ සංකල්පය ද විය. එතරම් සංගත ව ප්‍රකාශ නොකෙරුණ ද, බ්‍රාහ්මණයෝ බ්‍රහ්මයාගේ මුඛයෙන් ද, ශූද්‍රයෝ බ්‍රහ්මයාගේ පාදයෙන් ද මවනු ලැබූහ. මේ ආත්මයේ බ්‍රාහ්මණයකු ලබන ආත්මයේ දී ද බ්‍රාහ්මණයකු විය යුතු ය යන නිගමනයකට මේ ආත්මවාදය හා නිර්මාණවාදය ඔස්සේ බැස ගැනීමට හැකි වෙයි. බ්‍රහ්මන්ගේ මුඛයෙන් මවනු ලැබූ බ්‍රාහ්මණයකුගේ නොනැසෙන ආත්මය පසුව බ්‍රහ්මන්ගේ පාදයෙන් මවනු ලැබූ ශූද්‍රයකු ලෙස උත්පත්තිය ලබන්නේ කෙසේ ද? වෛදිකයන් ඒ නිරාකරණය කිරීම පිළිබඳ එතරම් උනන්දුවක් දක්වා ඇති බවක් නො පෙනෙයි.

කෙසේ වෙතත් වෛදිකයන්ගේ සංසාර චක්‍රය හා චක්‍රීය චින්තනය ඉතා දුර්වල එකක් බවත් එය ඒක රේඛීය චින්තනයට යට වී ඇති බවත් පෙනී යයි. බටහිර ආසියාවේ සිට පැමිණි යක්ෂ ගෝත්‍රිකයන්ට චක්‍රීය චින්තනයක් තිබී නැත. බටහිර ආසියාව ඒක රේඛීය චින්තනයට තෝතැන්නක් වී ඇති බව පෙනී යයි. යුදෙව් හා ඉස්ලාම් චින්තනවල උත්පත්තිය සිදු වී ඇත්තේ බටහිර ආසියාවෙහි ය. ක්‍රිස්තුස් වහන්සේ ද යුදෙව් ජනවර්ගයට අයත් ව බටහිර ආසියාවෙහි උපත ලැබී ය.

අප බොහෝ විට කියා ඇත්තේ (මෙවැනි කරුණු නැවත නැවතත් කීමට සිදු වී ඇත්තේ අද සමාජයෙහි අධිපතිවාදී මතවාදය එයට පටහැණි බැවිනි.) සිදුහත් කුමරු ඉපදුණු සමයෙහි දඹදිව ඊසාන හා නැගෙනහිර පෙදෙස්වල වෛදික මතවාද එතරම් පැතිරී ගොස් නොතිබුණු බවත් ඒ පෙදෙස්වල විසූවන්ට අර්ධ වෛදිකයන් යැයි කිවහැකි බවත් ය. යක්ෂ ගෝතිකයන් මේ පෙදෙස්වලට එතරම් සංක්‍රමණය වී ඇති බවක් ද නො පෙනෙයි. අර්ධ වෛදිකයන් අතර චක්‍රීය චින්තනය තිබුණ ද, යක්ෂ ගෝතිකයන්ට ඒ ලබාගැනීමට නොහැකි වන්නට ඇත. සිදුහත් තවුසාට දඹදිව ඊසාන හා නැගෙනහිර පෙදෙස්වල තිබූ චින්තනය බලපා ඇති බව පැහැදිලි ය.

එබැවින් දඹදිවට (භාරතයට) පැමිණි යක්ෂ ගෝත්‍රිකයනට චක්‍රිය චින්තනය නොලැබෙන්නට ඇත. දඹදිව වටහිර හා මධ්‍ය ප්‍රදේශ ඒ වන විටත් වෛදිකයන්ගේ භාරතය බවට පත්ව තිබූ අතර වෛදික සංස්කෘතිය එතරම් ප්‍රචලිත නොවූ දඹදිව ඊසාන හා නැගෙනහිර ප්‍රදේශවලට යක්ෂ ගෝත්‍රිකයන් විශාල වශයෙන් සංක්‍රමණය වී ඇති බවක් නො පෙනෙයි. යක්ෂ ගෝත්‍රිකයන්ට වැව් නිර්මාණය කිරීමේ තාක්ෂණය තිබුණ ද, දඹදිව දී ඉන් ප්‍රයෝජනයක් වී ඇති බවක් නො පෙනෙයි.

කෙසේ වෙතත් එකල ලංකාවේ වෛදික චින්තනය තහවුරු වී නො තිබුණි. ලංකාවට දඹදිවින් පැමිණියන් අර්ධ වෛදිකයන් වීම මෙහි දී බලපෑ වැදගත් සාධකයක් විය. දඹදිවට (භාරතයට) පැමිණි යක්ෂ ගෝත්‍රිකයනට මෙන් නොව ලංකාවට පැමිණි යක්ෂ ගෝත්‍රිකයන්ට චක්‍රීය චින්තනය දැන ගැනීමට හැකි වී ඇති බව පැහැදිලි ය. එහෙත් මෙහි දී ප්‍රශ්නයක් පැන නගියි. යක්ෂ ගෝත්‍රිකයන් චක්‍රීය චින්තනය ලබාගත්තේ ද යන්න ඒ ප්‍රශ්නයයි. යක්ෂ ගෝත්‍රිකයන්ගේ ස්වභාවය අනුව ඔවුහු අන්‍ය සංස්කෘතීන්ගෙන් යම් යම් දෑ අවශෝෂණය කිරීමට මැළි වෙති. යක්ෂ ගෝත්‍රිකයන්ට

© Prof. Nalin De Silva

බෞද්ධයන් වීමට බොහෝ කලක් ගත වී ඇති අතර මුල දී ඔවුන් බුදු දහමට විරුද්ධ වී ඇත. ඒ බව ආළවක ආදීන්ගේ දමනවලින් මෙන් ම මහියංගනයට බුදුන් වහන්සේ වැඩම කිරීම පිළිබඳ කතාවෙන් ද හෙළි වෙයි. මෑතක් වන තුරුම ලංකාවේ යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් ඇතැමකු අනෙක් බෞද්ධයන් පවත්වන අයුරින් බෞද්ධ චාරිත්‍ර වාරිත්‍ර පැවැත්වීමට විරුද්ධ වී ඇත. අදත් යක්ෂ ගෝත්‍රවලින් පැවතෙන්නන්ගෙන් සමහරකු බෞද්ධයන් ලෙස කටයුතු කරන්නේ තරමක් වෙනස් අයුරකින් බව වාර්තා වෙයි.

යක්ෂ ගෝත්‍රිකයන් චක්‍රීය චින්තනය ලබා නොගත්තේ නම් වැව් නිර්මාණය එවකට ලංකාවේ විසූ වෙනත් ගෝත්‍රයක් හෝ ගෝත්‍ර කිහිපයක් විසින් හෝ සිදු කෙරිය යුතුව තිබුණි. ඒ ගෝත්‍රිකයන්ට ඒ සඳහා අවශ්‍ය චින්තනය තිබුණ ද තාක්ෂණය නො වී ය. තාක්ෂණය තිබිණි නම් ඔවුන් යක්ෂ ගෝත්‍රිකයන් පැමිණීමට පෙර වැව් නිර්මාණය කළ යුතු ය. ඇතැම් විට සිදුවන්නට ඇත්තේ ඉතාමත් සංකීර්ණ ක්‍රියාවලියක් ඔස්සේ යක්ෂ ගෝත්‍රිකයන් වැව් නිර්මාණය කිරීමේ කාර්යයට එළඹීම විය හැකි ය.

යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් තාක්ෂණය ලබාගත් මෙරට සිටි නාග ගෝත්‍රිකයන් චක්‍රීය චින්තනය මත පදනම් වෙමින් වැව් නිර්මාණය අරඹන්නට ඇත. මෙහි දී වෙනත් ගෝත්‍රයක් නැතිව නාග යන්න සඳහන් කරන්නේ ඔවුන් ජලයට තිබූ සම්බන්ධයත් වැව් අසළ ඇති නාග රූපත් සැළකිල්ලට ගනිමිනි. නාගයන් වැව් කිහිපයක් තැනීමෙන් පසුව එහි ඇති වැදගත්කම තේරුම් ගත් යක්ෂ ගෝත්‍රිකයන් වැව් තැනීමට එකතුවන්නට ඇත. තාක්ෂණය යක්ෂ ගෝත්‍රිකයන්ගේ බැවින් ඔවුන් වඩාත් විශාල හා නිර්මාණයෙන් වටිනා වැව් නිර්මාණය කරන්නට ඇත. යකුන් බැඳි වැව් සංකල්පය තවමත් අප අතර පවතින බව අමතක නොකළ යුතු ය. එහෙත් යක්ෂ ගෝත්‍රිකයන් එක පයින්, එක රැයෙන් චක්‍රීය චින්තනය ලබා ගත්තේ යැයි නො සිතිය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva